## කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

## ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

## වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

මෙම ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකිකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. පුහුණු කිරීමේ නිලධාරි (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ) තනතුර - JM 1.1 (II ශ්‍රේණිය)

| | | |
|---|---|---|
| රැකියා විස්තරය | : | විෂයානුබද්ධ දේශන පැවැත්වීම, පුහුණු විශේෂඥවරයාට පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයන් සිදු කිරීම සඳහා සහාය වීම, පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම, පුහුණු වැඩසටහන් සඳහා පිරිවැය ඇස්තමේන්තු සැකසීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම හා පුහුණු වැඩසටහන්වල බලපෑම ඇගයීම. |
| සුදුසුකම් | : | <u>බාහිර අයදුම්කරුවන් සඳහා</u><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ගණකාධිකරණය/මූල්‍ය/ව්‍යාපාර කළමනාකරණ/ වාණිජ්‍යය හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයේ සිව් වසරක විශේෂ උපාධිය ලබා තිබීම<br>හෝ<br>පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ අන්තර් මධ්‍ය විභාගය සමත්ව තිබීම<br><u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u><br>ඉහත සුදුසුකම් සපුරා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත නිලධාරි (MA3) තනතුරක වසර පහක (05) සේවා පළපුරුද්ද. |
| වැටුප් පරිමාණය | : | JM 1.1 – (රු. 72,650 - 1,360 x 10 - 2,040 x 18 = 122,970/-)<br>(ආරම්භයේ දී රු. 58,615/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ) |
| වයස් සීමාව | : | වයස අවුරුදු 22 ට නො අඩු විය යුතු අතර, අවුරුදු 45 ට නො වැඩි විය යුතු ය. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | : | ලිඛිත තරගකාරී විභාගයක් සහ/හෝ වෘත්තීයවේදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

### 2. කළමනාකරණ සහකාර තනතුර (තාක්ෂණික නොවන) – MA 1.1 (III ශ්‍රේණිය)

| | | |
|---|---|---|
| **සුදුසුකම්** | : | <u>බාහිර අයදුම්කරුවන් සඳහා</u><br>අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමර්ථයන් සහිතව විෂයයන් හයක් එක් වරක දී සමත්ව තිබීම<br>සහ<br>අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම<br><u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u><br>අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමර්ථයන් සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම<br>සහ<br>ප්‍රාථමික මට්ටම - ශිල්පීය, අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නොවන සේවා කාණ්ඩ යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක සේවා පළපුරුද්ද. |
| වැටුප් පරිමාණය | : | MA1.1 – (රු. 46,220-540x10-630x7-890x4-1,190x20=83,390/-)<br>(ආරම්භයේ දී රු. 40,403/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ) |
| වයස් සීමාව | : | වයස අවුරුදු18 ට නො අඩු විය යුතු අතර, අවුරුදු 45 ට නො වැඩි විය යුතු ය. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | : | ලිඛිත තරගකාරී විභාගයක් සහ/හෝ වෘත්තීයවේදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

පොදු කරුණු : ඉහත සියලුම තනතුරු සඳහා අයදුම්කරුවන්ට ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීමේ හැකියාව හා පොදු පරිගණක යෙදවුම් හැසිරවීම පිළිබඳ දැනුම තිබිය යුතු ය.

උක්ත තනතුරු සඳහා තේරී පත්වන අයදුම්කරුවන් අදාළ රාජකාරී කටයුතු නිසි ලෙස ඉටු කිරීම සඳහා කායිකව මෙන්ම මානසිකව ද යෝග්‍ය විය යුතු අතර සේවා අවශ්‍යතාව මත ප්‍රධාන කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරී කටයුතු සිදු කිරීමට බැඳී සිටිය යුතු ය.

**<u>වෙනත් ප්‍රතිලාභ</u>**

- සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙළින් මූලික වැටුපෙන් 12% ක හා 3% ක දායකත්වයක් ආයතනය විසින් ලබා දෙනු ලැබේ.
  (සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක දායකත්වය මූලික වැටුපෙන් 10% කි)
- ආසන්නම නගර සඳහා ප්‍රවාහන පහසුකම් (කඩුවෙල/කොට්ටාව)

**<u>අයැදුම් කරන පිළිවෙළ</u>**

ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිත ඔබගේ සම්පූර්ණ ජීව දත්ත සටහන, අදාළ සහතිකවල පිටපත් සහිත ව ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට **2025 අප්‍රේල් මස 11** වන දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු ය. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතනයේ ප්‍රධානීන් මගින් යොමු කළ යුතු වේ. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයැදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. කිනම් තත්ත්වයක් යටතේ වුව ද අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාර ගනු නො ලැබේ.

**සැලකිය යුතුයි :**

- වඩාත්ම සුදුසුකම් සපුරන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබනු ඇත.
- මෙම දැන්වීම www.nipm.gov.lk යන වෙබ් අඩවියේ ද පළකොට ඇත.

**අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි**
**ජාතික වැවිලි කළමනාකරණ ආයතනය**
**එම්.ඩී.එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය.**
**දුරකථනය : 011-2770232**